# එක්සත් ජනපද මැරීන් බලකාය ආරම්භ කිරීමේ 247 වැනි සංවත්සරයේදී තානාපතිනී චංග් පැවැත්වූ දේශනය

නොවැම්බර් 18, 2022

සුභ සන්ධ්‍යාවක් වේවා, ඔබ සැම සාදරයෙන් පිළිගන්නවා. එක්සත් ජනපද මැරීන් බලකාය ආරම්භ කිරීමේ 247 වැනි සංවත්සරය සැමරීමට ඔබ හැමදෙනා සමගින් සම්බන්ධ වන්නට ලැබීම භාග්‍යයක් සහ සතුටක්. එහි කීර්තිමත් ඉතිහාසය පුරාම මැරීන් බලකාය එක්සත් ජනපද රාජ්‍ය තාන්ත්‍රික කටයුතුවලට සම්බන්ධ වී තිබෙනවා. 1948 දී සමුද්‍රීය ආරක්ෂක වැඩසටහනේ පැමිණීමත් සමඟ මැරීන් බළකාය සහ රාජ්‍ය දෙපාර්තමේන්තුව අතර පැවති දීර්ඝ කාලීන සබඳතාවය නිල වශයෙන් තවදුරටත් ගැඹුරු වූවා. අද වනවිට රටවල් 150කට අධික සංඛ්‍යාවක එ.ජ. රාජතාන්ත්‍රික ධූතමණ්ඩලවල මැරීන් ආරක්ෂක භටයින් සේවය කරන අතර එක්සත් ජනපදයේ පැවැත්මෙහි සහ සත්කාරක රාජ්‍යයන් සමගින් අපේ ඇති සම්බන්ධතාවයට කරන ආයෝජනයෙහි දෘෂ්‍යමය සංකේතයක් වශයෙන් බොහෝදෙනා විසින් ඔවුන් සලකනු ලබනවා.

කොළඹ අපගේ තානාපති කාර්යාලයෙහි මැරීන් ආරක්ෂක භටඛණ්ඩයට මා පැමිණෙන ප්‍රාන්තය වන කැලිෆෝනියා ප්‍රාන්තයෙන් ආ මැරීන් භටයින් දෙදෙනෙක් ද, මැසචුසෙට්ස්, ඔක්ලහෝමා, ටෙක්සාස්, නෙවාඩා, මිසූරි සහ ෆ්ලොරිඩා යනාදී ප්‍රාන්තවලින් ආ මැරීන් භටයින් ද ඇතුළත් වනවා. අපේ රටේ විවිධ ප්‍රදේශවලින් එන මේ මැරීන් භටයින් හරහා පිළිබිඹු වන්නේ එක්සත් ජනපදයේ ප්‍රබලතම ශක්තියක් වන, විවිධත්වය පිළිගැනීමට සහ විවිධාකාර පුද්ගලයින් සතු සුවිශේෂී කුසලතා යොදාගැනීමට අපේ ඇති සූදානමයි. අපගේ සම්පත් සහ කාර්යමණ්ඩලය ආරක්ෂා කරගැනීම සඳහා අපි තානාපති කාර්යාලයේ සිටින මැරීන් ආරක්ෂක භටයින් මත විශ්වාසය තබනවා. මා කොතරම් උදෑසනින් කාර්යාලයට පැමිණියත්, කොතරම් ප්‍රමාදවී කාර්යාලයෙන් පිටවී ගියත් සෑම දිනකම මා කාර්යාලයේ මුලින්ම සහ අවසානයට දකින පුද්ගලයින් වන්නේ ඔවුන්.

ළමයින් වශයෙන් කොරියානු යුද්ධය කාලයේ ජීවත් වූ මගේ මවුපියන්ටත්, නිල ඇඳුමින් සැරසුනු එක්සත් ජනපද කාර්යමණ්ඩලය දැකීමෙන් ආරක්ෂිත හැඟීමක් දැනුනාක් මෙන්ම, අපට රැකවල් ලා මැරීන් භටයන්සිටින බව දැනීම මට සැනසිල්ලක් වනවා. කොරියාවේ පශ්චාත් යුධ සමයේදී ඇමරිකානු බලකා ආරක්ෂාව සහ සන්සුන්බව ලබා දී තිබෙනවා. එවකට ඔවුන් හර්ශිස් කිසස් නැමැති රසවත් චොකලට් බෙදාදුන් ආකාරය මගේ මවුපියන් සතුටින් සිහිකරනවා. වසර ගණනාවකට පසුව අපේ නිවහන බවට පත් වූ එක්සත් ජනපදය සම්බන්ධයෙන් ඔවුන් පළමුවරට අත්විඳි අවස්ථාව වූයේ එයයි. කොරියානු යුද්ධය මධ්‍යයේ පවා, අපේ රට මගේ පවුල තුළ එදා ඇති කළ සුභවාදී හැඟීම පිළිබඳ කුඩා සිහිගැන්වීමක් වශයෙන් අද සැන්දෑවේ සෑම මේසයකම හර්ශිස් කිසස් තබා තිබෙනවා—එක්සත්

ජනපදය ඔබ තුළත් බලාපොරොත්තුව දැල්වූ අවස්ථා ඔබේ මතකයට විත් ඔබේ මුහුණේ සිනාවක් නගන්නට ඒවා හේතුවේයැයි සිතනවා. එක්සත් ජනපදයට ආ සංක්‍රමණිකයකු වශයෙන් බොහෝ අවස්ථා සහිතව හැදී වැඩෙන්නට සහ රාජතාන්ත්‍රික විෂය ක්ෂේත්‍රය මාගේ වෘත්තිය කරගැනීමට හැකිවීම මා ලැබූ භාග්‍යයක්. රාජතාන්ත්‍රිකයින් වශයෙන් අපි, සේවය ලබාදීම පිළිබඳ ප්‍රබල ආචාරධර්ම මෙන්ම, අපේ රටේ උසස්තම ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයන් සපුරාලීම සඳහා කැපවීම යන වටිනාකම් අපගේ මිලිටරි සගයින් සමගින් බෙදාහදා ගන්නවා. නිවහනෙන් බොහෝ දුර බැහැර සිටින්නට වීම ගැන අපි දන්නවා, අපේ මෙහෙවර සම්බන්ධයෙන් අපට ඇති බලවත් හැඟීම හේතුවෙන් ඒ සමගින් බැඳී ඇති ඕනෑම අභියෝගයකට මුහුණදීමට අපි සූදානමින් පසුවෙනවා. සියරටියන් සමගින් එකිනෙකාට උපකාර කරගන්නා ප්‍රජාවක් ගොඩනැංවීමට අපි එක්ව සිටිනවා. විශේෂයෙන්ම, මෙහිදී, අපේ උපකාරක ජාලයේ කොටස්කරුවන් වී සිටින අපගේ ශ්‍රී ලාංකික සගයන් ලබන්නට අපි වාසනාවන්ත වී තිබෙනවා.

අපි හැමදෙනාම එකිනෙකා පිළිබඳව සොයාබලනවා. මැරීන් ආරක්ෂක භටයින් ගැන කථා කිරීමේදී, ඛේදජනක සිදුවීම්වලදී පවා අපට පළමුව ප්‍රතිචාර දක්වන්නන් වන්නේ ඔවුනුයි. අනෙක් අය අන්තරායක් හමුවේදී ඊට ප්‍රතිවිරුද්ධ දෙසට දිව යද්දී, මැරීන් භටයින් අන්තරාය දෙසට දිව යනවා. 1968 Tet Offensive ක්‍රියාදාමයේදී වියට්නාම තානාපති කාර්යාලය ආරක්ෂා කරදීමේ සිට, කෙන්යා තානාපති කාර්යාලයේ 1998 සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාරයට ප්‍රතිචාර දැක්වීම දක්වා, මැරීන් භටයින් නිරත්තරයෙන් තමන් පිළිබඳව සිතීම පසෙක ලා, බොහෝවිට වීරයින් ලෙස ක්‍රියා කර තිබෙනවා. අපගේ රාජතාන්ත්‍රික පරිශ්‍ර සහ කාර්යය සගයින් ආරක්ෂා කරගැනීම සඳහා දිවි පරිත්‍යාගයෙන් කටයුතු කළ බොහෝ මැරීන් භටයින් සිටිනවා. බොහෝ තරුණ, කුසලතා සම්පන්න, කාන්තා සහ පිරිමි මැරීන් භටයින් මේ අන්තරායයන් පිළිබඳ දැන දැන ම, කැමැත්තෙන්ම ලොව වටා ඇති අපේ තානපති කාර්යාල සහ කොන්සල් කාර්යාල ආරක්ෂා කරන්නට ඉදිරිපත්වීමෙන් පෙන්නුම් කෙරෙන්නේ ඔවුන්ගේ ධෛර්යය, සූදානම සහ දක්ෂතාවයයි. එක්සත් ජනපද මැරීන් භටයින්ගේ නිර්භීතකම අපේ ජාතියට ගෞරවයක්.

නොවැම්බර් 10 වැනිදාට මැරීන් බලකායේ උපන්දිනය යෙදී ඇත්තේ හමුදා ප්‍රවීණයින්ගේ දිනය (Veteran’s Day) ට පෙර දිනයේ දී යි. මේ අවස්ථාවේ දී මැරීන් භටයින්ට ස්තුති කිරීම සඳහා මොහොතක් ගන්නට මා කැමතියි. දැනට සේවයේ නියුතු මැරීන් භටයින් මෙන්ම, අප සමගින් මෙහි සිටින සියළුම මැරීන් ප්‍රවීණයින්ට, ඔබ හට සිටගැනීමට හැකි නම් එසේ කරන මෙන් මා ඉල්ලා සිටිනවා. ඒ සියළු දෙනා වෙත මාගේ ස්තුතිය පිරිනමනවා. ඒ වාගේම, දැනට නිල ඇඳුමින් සේවයේ නියුතුව සිටින, සහ සේවයේ නියුතුව සිටි, මෙහි සිටින සියළුම දෙනාට ඔබේ කැපවීම සහ සියළු පරිත්‍යාග වෙනුවෙන් මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමනවා. ඔබේ

කැපකිරීම්, වෘත්තීයභාවය සහ එඩිතරකම අප කවුරුත් පිළිගැනිමට ලක් කරනවා, අගය කරනවා.

කොළඹ පිහිටි එ.ජ. තානාපති කාර්යාලයේ මැරීන් ආරක්ෂක භටයින් සිටීම, අප දෙරට අතරේ බැඳීම් පවත්වාගෙන යෑමට සහ ශක්තිමත් කිරීමට සිදුකළ යුතු අත්‍යාවශ්‍ය කාර්යභාරය අඛණ්ඩව කරගෙන යෑම සඳහා අපට ආරක්ෂිතබවේ සහ සුරක්ෂිතබවේ පදනමක් සපයා දෙනවා. එක්සත් ජනපදයට ගමන් කිරීම සඳහා පහසුකම් සැලසීමේ සිට හුවමාරු හා සංස්කෘතික වැඩසටහන් හරහා දෙරටේ ජනතාව අතරේ සම්බන්ධතා පෝෂණය කිරීම; අන්‍යොන්‍ය සෞභාග්‍ය සඳහා ආර්ථික හුවමාරු ශක්තිමත් කිරීම; ආරක්ෂක සහයෝගීතාවය වැඩිදියුණු කිරීම; අපට පොදු මානව හිමිකම් අරමුණු සාකච්ඡා කිරීම; සහ යහපාලනය ප්‍රවර්ධනය කිරීම ඇතුළු පුළුල් පරාසයක ගැටළු සම්බන්ධයෙන් මාගේ කණ්ඩායම වැඩ කරනවා. මේ සැන්දෑවේ අප සමගින් එක්වන අමුත්තන් ද අපගේ ද්වී පාර්ශවීය සබඳතා වැඩිදියුණු කිරීම සඳහා වෙහෙස නොබලා වැඩකරමින් මේ වෑයම් සඳහා හවුල්වන බව මා දන්නවා. අප හැමදෙනාම වෙනුවෙන්, මා මැරීන් බලකායට සුභ 247වැනි ජන්ම දිනයක් ප්‍රාර්ථනා කරනවා-ස්තුතියි, සදා විශ්වාසවන්තව සිටිමු (*Semper Fidelis*)